# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,929- 2015 අගෝස්තු මස 21 වැනි සිකුරාදා - 2015.08.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 846 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 847 |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 සැප්තැම්බර් මස 11 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පිස්කල් විකිණීම්

## කඩුවෙල/දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය

කොළඹ දිසා අධිකරණ නඩු අංකය : DMB/ 000151- 12
කඩුවෙල දිසා අධිකරණ ඇස්කිසි අංකය : 36/2015

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,
අංක 40, නවම් මාවත,
කොළඹ 02.

..................................පැමිණිලිකරු.

එදිරිව

01. ජිනිව් ඉමොජින් ෂාමි ද සිල්වා,
විවාහයට පෙර ෆර්නැන්ඩස්,
අංක 86/E/2/1, ජෝතිපාල මාවත,
මාලඹේ.

02. යාලගලගේ ප්‍රසන්න ද සිල්වා,
අංක 86/E/2/1, ජෝතිපාල මාවත,
මාලඹේ.

.........................................විත්තිකරුවන්.

ඉහත නම් සඳහන් විත්තිකරුවන් වෙතයි.

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ ඇතුලත් කර ඇති වර්ෂ 2013 ජුනි මස 07 වන දිනැති තීන්දු ප්‍රකාශය අනුව,

01. පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි රු.1,727,669.60 ක මුදලක් සහ 2011.12.01 දින සිට එකී සම්පූර්ණ මුදල සහ පොළිය ගෙවා නිදහස් වන තුරු රුපියල් දහහත්ලක්ෂ විසිපන්දහස් විසිහත්දහස් හයසිය හැට නවයයි ශත හැටක (රු.1,727,669.60) මුදල මත තීන්දු ප්‍රකාශයේ දින දක්වා වසරකට 13% බැගින් පොලියද ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සඳහන් මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිදහස් වන තුරු තීන්දු ප්‍රකාශයේ සඳහන් මුළු මුදල මත වසරකට 13% බැගින් වූ අමතර පොලියක් ද විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයකර ගැනීමට හැකි බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

02. පැමිණිල්ලේ සහ මෙහි පහත උපලේඛනයේ වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර දක්වා ඇති ඉඩම සහ දේපල තුල පිහිටි ගහකොල පලතුරු ආදිය සහ මතුවට එහි ඉදිකරනු ලබන සියලු ගොඩනැගිලි ද ඉහත කී රු. 1,727,669.60 ක මුදල සහ 2011.12.01 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් එකතු වූ මුදල මත වාර්ෂිකව 13% බැගින් වූ පොලියද ඊට පසු එකී දිනයේ සිට එකී මුදල මුළුමනින්ම ගෙවා නිම වන දිනය දක්වා නෛතික පොළියද අයකර ගැනීමට විශේෂයෙන් බැඳී ඇති බවට හා මෙම දේපල විකිණීමට හැකි බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

03. ඉහත කී මුළු මුදල විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් ඉහතකී පරිදි විශේෂිතව බැඳී ඇති පරිදි සහ ක්‍රියාවේ යෙදවීමට යටත්ව ඇති බවට ප්‍රකාශිත මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති දේපල සහ පරිශ්‍රය සහ ගොඩනැගිලි අධිකරණය විසින් නිසිලෙස පත් කරන ලද වෙන්දේසිකරුවෙකු විසින් අධිකරණය විසින් නියම කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත නිසි පරිදි දැන්වීම් පල කිරීමෙන් පසුව පැමිණිලිකරු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට හැකි බවට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

04. තවද, මෙම නඩුවේ විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට නඩු ගාස්තු ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

එකී නඩු තීන්දුව ප්‍රකාරව පැමිණිලිකරුට විත්තිකරු වන නුඹ විසින් එකී තීන්දුව අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වී පැහැර හැර ඇති හෙයින් කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද විකිණීමේ අධිකාරී පත්‍රය මත කඩුවෙල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපල එකී දේපල පිහිටා ඇති බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ මාළඹේ පිහිටි තේක්කගහවත්ත නොහොත් මිරිස්හේන යන නමින් හඳුන්වනු ලබන 1193 A හි සඳහන් ලොට් අංක 2 දරන ඉඩම මා විසින් වර්ෂ 2015 ක් වූ ඔක්තෝබර් මස 15 වන දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පාළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුල මාළඹේ හි පිහිටි තේක්කගහවත්ත නොහොත් මිරිස්හේන යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. තෙපුලන්ගොඩ විසින් මැන සාදන ලද වර්ෂ 2001.12.24 දින පිඹුරු අංක 1193 A මැන බෙද වෙන්කළ ලොට් අංක 02 දරන ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : ඩී. එම්. ගුණවතීගේ ඉඩමෙන්ද, නැගෙනහිරට : පිඹුරු අංක 146 හි ලොට් 1 ද, දකුණට : පිඹුරු අංක 146 හි ලොට් 08 සහ බටහිරට : පිඹුරු අංක 146 හි ලොට් 08 සහ 03 ද යන මෙකී මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි (අ. 0, රූ. 0, පර්. 06) හෝ හෙක්ටයාර් 0.01517 ක ඉඩම වන අතර ඒ සමග ඒ තුල පිහිටි ගොඩනැගිලි ගස්කොලන් ඇතුලු සියලු දේ ද වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1557/19 හි ලියාපදිංචි වී ඇත.

ඒ සමගම පහත සඳහන් ඉඩම මතින් මාර්ග අයිතියද වේ.

1. ඉහත පරිදි මාලඹේහි පිහිටි තේක්කගහවත්ත නොහොත් මිරිස්හේන යන නමින් හඳුන්වනු ලබන ඉහත පිඹුරු අංක 1193A පරිදි මැන බෙද වෙන් කළ ලොට් අංක 08 දරන (පාරක් සඳහා වෙන් කරන ලද) ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : පිඹුරු අංක 146 හි ලොට් 3, 2 සහ 1 ද, නැගෙනහිරට : ප්‍රසාද් සිල්වාගේ ඉඩමෙන් සහ අඩි 15 ක් පළල පාරෙන් ද, දකුණට : ඩබ්. කරුණාවතීගේ ඉඩමෙන් සහ පිඹුරු අංක 146 හි ලොට් 7, 6, සහ 5 සහ බටහිරට : පිඹුරු අංක 146 හි ලොට් 4 ද යන මෙකී මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 8.25) ක ඉඩම වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1557/20 හි ලියාපදිංචි වී ඇත.

2. ඉහත පරිදි මාළඹේ හි පිහිටි තේක්කගහවත්ත නොහොත් මිරිස්හේන යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එන්. ටී. අනිල් සිල්වා විසින් මැන සාදන ලද 1997.08.03 දින පිඹුරු අංක 146 පරිදි මැන බෙද වෙන් කළ ලොට් අංක B3 (පාරක් සඳහා වෙන් කරන ලද) දරන ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : පිඹුරු අංක 146 හි ලොට් B2 ද, නැගෙනහිරට : අඩි 15 ක් පළල පාරෙන් ද, දකුණට : එකී පිඹුරු අංක 586 හි ලොට් C සහ බටහිරට : පිඹුරු අංක 146 හි ලොට් B1 ද, යන මෙකී මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම හයයි බින්දුවයි (අ. 0, රූ. 0, පර්. 3.60) ක ඉඩම වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1430/229 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
කඩුවෙල දිසා අධිකරණය,
කඩුවෙල.

වර්ෂ 2015 ක් වූ අගෝස්තු මස 04 වැනි දින,
කඩුවෙල දිසා අධිකරණයේ දී ය.

08-518

# නොතාරිස් ලැයිස්තුව

### දැන්වීමයි

නොතාරිස් ආඥාපනත (අවලංගු කිරීම)

අවිස්සාවේල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් දෙන් සුමනසිංහ බෝධිනාගොඩ මහතාගේ නොතාරිස් බලපත්‍රය නොතාරිස් ආඥා පනතේ 20 වන වගන්තිය යටතේ ගරු ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් අවලංගු කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

එස්. ඩී. ඒ. බී. බොරලැස්ස,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2015 ජූලි මස 22 වැනි දින,
කොළඹ දී ය.

08-639

---

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම)

නොතාරිස් ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

1. ගල්කිස්ස, ටෙම්ප්ලර්ස් පාර, මේජර් ගුණරත්න මාවත, අංක 29 හි පදිංචි, විදාන මහදුරගේ ආනන්ද විමලවීර මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,
2. රත්මලාන, ගාලු පාර, අංක 227 හි පදිංචි, ගල්හේනගේ ප්‍රගීත් මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,
3. නුගේගොඩ, ඇඹුල්දෙනිය, බෝධිය පාර, මොරගහ පටුමග, අංක 77/29 හි පදිංචි, කත්‍රිආරච්චිගේ දෙන් සුජීව ඉන්දික සිරිවර්ධන මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2014 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

08-484/1

---

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම)

නොතාරිස් ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

1. කොළඹ 05, ඊ. ඩී. දබරේ මාවත, අංක 25/6 හි පදිංචි, කනිෂ්ක දුෂ්‍යාන්ත් පලිහක්කාර මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,
2. කොළඹ 06, කිරුළපන, එඩ්මන්ටන් පාර, අංක 12 හි පදිංචි, ජයසූරිය ආරච්චිගේ සුනාලි මදුවන්ති මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,
3. කොළඹ 01, රෝහල් පටුමග, අංක 61 හි පදිංචි, නානායක්කාර නෙත්තසිංහගේ පවිත්‍රා සංදීපනී මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,
4. මීගමුව, තිඹිරිගස්කටුව, ප්‍රේමචන්ද්‍රවත්ත, අංක 276/25 ජී හි පදිංචි, උස්හෙට්ටිගේ දෙෝන යසසි නදීකා තරංගි උස්හෙට්ටි මහත්මිය, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,
5. කටාන, කඳවල, එවර් ග්‍රීන් ගාඩ්න්, අංක 398/23 හි පදිංචි, විජේසුන්දර මුදියන්සේලාගේ ආනන්ද වසන්ත කුමාර විජේසුන්දර මහතා, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2014 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

08-484/2

---

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම)

නොතාරිස් ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

1. බලංගොඩ, පින්නවල, පල්ලෙවෙල, හතරමංහන්දිය හි පදිංචි, විජේසිංහගේ විජයසිංහ කුලතුංග මහතා, රත්නපුරය අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,
2. මුල්ලේරියාව, හිඹුටාන පාර, අංක 305/4 එම් හි පදිංචි, කාමර හේවාගේ සුමිත්‍රපාල මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,
3. මුතූර් - 04, ජායා පාර, අංක 45 හි පදිංචි, ජෙසීනා ෆහ්මි මහත්මිය, ත්‍රිකුණාමලය අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන්ගෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,
4. මාලඹේ, මුවන්හෙලවත්ත පාර, අංක 743/48 හි පදිංචි, කොළඹගේ දොන් භාග්‍යා මනෝරි මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,
5. නුගේගොඩ, උඩහමුල්ල, 4 වන පටුමග, කුඹුක්ගහ පොකුණ පාර, අංක 23/14 හි පදිංචි, ලොකු මරක්කලගේ දිනේෂා ජයමිණි මෙනවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2014 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-484/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.